

# වෙළෙඳ භාණ්ඩ සැපයීම සඳහා C&A ආචාර ධර්ම සංග්‍රහය

<u>අවධානයයි:</u> මෙය ඉංග්‍රීසි ලේඛනයක පරිවර්තනයකි. නෛතික වශයෙන් අදාළ වනුයේ මුල් ඉංග්‍රීසි අනුවාදයයි.

- 2015 අප්‍රේල් -

# හැඳින්වීම

**C&Aහි ව්‍යාපාර ආදර්ශය වනුයේ උසස් තත්ත්වයේ විලාසිතා නිෂ්පාදන දැරිය හැකි මිලකට ලබා දීමයි.එය ව්‍යාපාර විශ්වසනීයත්වයේ උසස් ප්‍රමිතීන් අනුගමනය කර මිනිසුන් හා පරිසරය කෙරෙහි සැලකිල්ලක් දක්වමින් තිරසාර අන්දමකින් ඉටු කිරීමට අපි ඇප කැප වී සිටින්නෙමු.**

දිගු කාලීනව බැලීමේදී C&A හා එහි සැපයුම්කරුවන්ට අඛණ්ඩව සාර්ථකත්වය ළඟා කර ගත හැකි එකම ක්‍රමය එය බව් අපි විශ්වාස කරමු.

වෙළෙඳ භාණ්ඩ සැපයීම සඳහා ආචාර ධර්ම සංග්‍රහය මගින් (“ආචාර ධර්ම සංග්‍රහය) C&A විසින් නීතිරීතිවලට අනුකූලතාව දැක්වීම, ශ්‍රම පරිචයන්, පාරිසරික ක්‍රියාකාරීත්වය හා දූෂණවලට එරෙහි වීම සම්බන්ධයෙනේ සැපයුම්කරුවන් අපේක්ෂා කරනුයේ මොනවා ද යන්න විස්තර කරයි.තත්ත්ව ප්‍රමිතීන්, නිෂ්පාදන ප්‍රමිතීන් හා බෙදා හැරීමේ උපදෙස් වැනි අනෙකුත් කාරණාවලට සම්බන්ධ පූර්වාපේක්ෂණයන් වෙනත් ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශවලින් ආවරණය කෙරේ. ආචාර ධර්ම සංග්‍රහයේ අවශ්‍යතා ආචාර ධර්ම සංග්‍රහය සඳහා වන ආධාරක මාර්ගෝපදේශවලින් වැඩිදුර විස්තර කරනු ලැබේ.

මෙකී අවශ්‍යතාවන් C&A වෙත වෙළෙඳ භාණ්ඩ සපයන සියලු සැපයුම්කරුවන් සඳහා අදාළ වේ.[1]. ආචාර ධර්ම සංග්‍රහයේ විධිවිධානවලින් දක්වා ඇත්තේ උපරිම ප්‍රමිතීන් නොවන අතර අවම ප්‍රමිතීන් වන බව දැන සිටීම වැදගත් වේ. සැපයුම්කරුවන් විසින් වැඩ කිරීමේ තත්ත්වයන් හා පාරිසරික ක්‍රියාකාරීත්වයන්හි අඛණ්ඩ දියුණුව ඉලක්ක කරනු ඇතැයි C&Aවිසින් අපේක්ෂා කරයි.

1. නිෂ්පාදන ඒකක, හවුල් සමාගම්, ඒකාබද්ධ සමාගම් හා නියෝජිතයින් ඇතුළුව. මෙම අවශ්‍යතාවන් C&Aසඳහා වන නිෂාපාදනයන්ට පමණක් නොව වෙනත් කවර හෝ තෙවෙන පාර්ශ්වයක් සඳහා වන නිෂ්පාදනයන්ට ද අදාළ වේ.

# අවශ්‍යතා

## එක්සත් ජාතීන්ගේ ගෝලීය ගිවිසුමෙහි ඇති ප්‍රතිපත්ති දහය C&A මගින් අනුගමනය කරනු ලබයි.

සැපයුම්කරුවන් විසින් ඔවුන්ගේ මෙහෙයුම් වගකීම් සහගත ලෙස ක්‍රියාත්මක කරනු ඇති බවත් මිනිසා සහ පරිසරය ආරක්ෂා කිරීමට සියලු ප්‍රයත්නයන් ගනු ඇති බවත් C&A අපේක්ෂා කරයි.

පහත වගුවෙන් ආචාර ධර්ම සංග්‍රහයේ සාරාංශයක් ඉදිරිපත් කෙරේ.

## අවශ්‍යතාවන්ගේ සාරාංශය

### 1. නීතිරීතිවලට අනුකූලතාව දැක්වීම

- සෑම අවස්ථාවකම ජාතික හා අනෙකුත් අදාළ නීතිරීතිවලට අනුකූලතාව දැක්වීම
- බුද්ධිමය දේපළ අයිතීන්ට ගරු කිරීම

### 2. ශ්‍රමය

- ළමා ශ්‍රමය භාවිතයෙන් වළකින්න
- සේවයෙහි නියුක්ත කරවීමේදී වෙනස්කම්වලට භාජනය නොකළ යුතුය
- බලහත්කාරයෙන් ශ්‍රමය ලබා නොගත යුතුය
- සමිති සමාගම්වලට බැඳීමේ හා සාමූහික ලෙස ඉල්ලීම් කිරීමේ නිදහසට ගරු කළ යුතුය
- දරුණු හෝ අමානුෂික සැලකිලිවලට බඳුන් නොකළ යුතුය
- සුරක්ෂිත හා සනීපාරක්ෂාව සහිත වැඩ පරිසරයක් ලබා දිය යුතුය
- අවදානමට ලක් විය හැකි කාණ්ඩ පිළිබඳ විශේෂ සැලකිල්ලක් යොමු කළ යුතුය
- විධිමත් ලෙස සේවයේ නිරත කරවිය යුතුය
- කලට වේලාවට වේතන ලබා දිය යුතුය
- අතිරික්ත පැය ගණන් වැඩෙහි නොයෙදවිය යුතුය

### 3. පරිසරය

- නෛතික අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්විය යුතුය
- පාරිසරික ක්‍රියාකාරීත්ව කළමනාකරණය
- බලශක්ති හා ජල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම
- පරිසරයට අපද්‍රව්‍ය හා විමෝචක මුදා හැරීම අවම කිරීම
- සැපයුම්දාමය තුළ අනතුරුදායක රසායන ද්‍රව්‍ය භාවිතය අවම කිරීම

### 4. දූෂණවලට එරෙහි වීම

- අල්ලස් හෝ දූෂණවලට ඉඩක් නැත

# 1. නෛතික අනුකූලතාව

- සැපයුම්කරුවන් විසින් සෑම අවස්ථාවකම ජාතික හා අනෙකුත් අදාළ නීතිරීතිවලට අනුකූලතාව දැක්විය යුතුය.
- නීතියේ විධිවිධාන හා ආචාර ධර්ම සංග්‍රහය මගින් එකම විෂය කරුණක් ගැන කියවෙන අවස්ථාවක සැපයුම්කරුවන් විසින් කම්කරුවන් හෝ පරිසරයට වැඩි ආරක්ෂාවක් සපයන විධිවිධානය අදාළ කර ගත යුතුය.
- සැපයුම්කරුවන් විසින් බුද්ධිමය දේපළ අයිතීන් ගරු කෙරෙනු ලබන බව ද අනීතික පිටපත් පිරිනැමීමක් හෝ නිෂ්පාදනයක් සිදු නොවන බවට වග බලා ගත යුතුය.

# 2. ශ්‍රමය

මෙම කොටසේ ඇති අවශ්‍යතා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ, ගෝලීය සමාජ අනුකූලතා වැඩසටහනේ හා සදාචාරාත්මක වෙළෙඳ මූලාරම්භක පදනම් සංග්‍රහයේ ප්‍රමිතීන් මත පදනම් වේ.

C&A මගින් මානව අයිතිවාසිකම්වලට ගරු කරන අතර මානව අයිතිවාසිකම් අපයෝජනය හා සම්බන්ධ අනිසි සහාය වැළැක්වීමට කටයුතු කරයි. සැපයුම්කරුවන් විසින් කම්කරුවන්ගේ මානව අයිතිවාසිකම්වලට ගරු කරනු ඇතැයි ද මෙම කොටසේ ඇති අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරනු ඇතැයි ද C&A අපේක්ෂා කරයි.

## 2.1. ළමා ශ්‍රමය

- දේශීය නීතියෙන් නියම කොට ඇත්නම්, කම්කරුවන් අවම වශයෙන් වයස අවුරුදු 16ක් හෝ ඊට වැඩි විය යුතු අතර මීට අනිවාර්ය අධ්‍යාපනය හා සම්බන්ධ නීතිරීති ද අදාළ විය යුතු වේ.
- අනතුරුදායක වැඩෙහි යෙදෙන හෝ රාත්‍රී රාජකාරිවල යෙදෙන සේවකයින් අවම වශයෙන් වයස අවුරුදු 18ක් විය යුතුය.

## 2.2. වෙනස්කම්වලට භාජනය කිරීම

- සැපයුම්කරුවන් විසින් සේවා නියුක්තිය සම්බන්ධ වෙනස්කම්වලට භාජනය කිරීම, ඊට අනුබල දීම හෝ එබන්දක් ඉවසා සිටීම නොකළ යුතුය.[2].
- සේවකයන් අතර වෙනේ කොට හඳුනා ගැනීමට හේතු විය යුත්තේ රාජකාරියේ යෙදීමට ඇති කැමැත්ත හා හැකියාව මිස පුද්ගලික ලක්ෂණ නොවිය යුතුය[3].

## 2.3. බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම

- කම්කරුවන් සිය රාජකාරී ස්වේච්ඡා පදනමකින් සිදු කළ යුතුය. මින් අදහස් වනුයේ, ඇපයකින් හෝ ගිවිසුමකින් බැඳුණු හෝ සිරගත ශ්‍රමය ඇතුළුව කවර හෝ ආකාරයකින් බලහත්කාර ශ්‍රමය ලබා ගැනීම තහනම් බවය.
- සැපයුම්කරුවන් විසින් තැන්පත් කිරීම් ඉල්ලීමෙන්, අනන්‍යතා ලේඛන රඳවා තබා ගැනීමෙන් හෝ වේතන රඳවා ගැනීමෙන් සේවයෙහි නියුක්ත වීමේ නිදහස් වරණය උල්ලංඝනය නොකළ යුතුය.
- සාධාරණ දැනුම්දීමකින් පසු සිය සේවය අවසන් කිරීමට සැපයුම්කරුවන් විසින් සේවකයින්ට ඉඩ ලබා දිය යුතුය.

---

2. බඳවා ගැනීම, සේවය ලබා ගැනීම, පුහුණු කිරීම, වැඩ තත්ත්වයන්, රාජකාරී පැවරීම්, වන්දි, උසස් වීම්, විනය, සේවය අවසන් කිරීම හා විශ්‍රාමය ඇතුළුව
3. එබඳු පුද්ගලික ලක්ෂණවලට පහත සඳහන් දෑ ඇතුළුව ඊට අමතර තවත් බොහෝ දෑ ඇතුළත් වේ: ස්ත්‍රී පුරුෂභාවය, වයස, ආගම, විවාහක අවිවාහක බව, ජාතිය, කුලය, සමාජ පසුබිම, රෝගාබාධ, ආබාධිත බව, ගර්භනීභාවය, ජනවාර්ගික හා ජාතික සම්භවය, ජාතිකත්වය, වෘත්තීය සමිති, දේශපාලන සම්බන්ධතා හා ලිංගික නැඹුරුව ඇතුළත්ව කම්කරු සංවිධානවල සාමාජිකත්වය.

## 2.4. සමාගමයේ නිදහස

- සැපයුම්කරුවන් විසින් කම්කරු නියෝජිතත්වය කෙරෙහි විවෘත හා සහයෝගාත්මක ආකල්පයක් දරමින් අභිමත වෘත්තීය සමිති පිහිටුවීමට හෝ ඒවාට බැඳීමට හා සාමූහිකව ඉල්ලීම් කිරීමට ඉඩ ලබා දිය යුතුය.
- කම්කරු නියෝජිතයින්ට සිය නියෝජිත කාර්යයන් සිදු කර ගනෙ යාමට හැකිවන පරිදි සැපයුම්කරුවන් විසින් ඔවුන්ට සේවාස්ථානය වෙත ප්‍රවේශය ලබා දිය යුතුය.
- සමාගමයේ නිදහස හා සාමූහිකව ඉල්ලීම් කිරීමේ නිදහස නීතිය මගින් සීමා කර ඇති අවස්ථාවන්හි සැපයුම්කරුවන් විසින් කම්කරු නියෝජිතත්වය හාසම්බන්ධතාවට අදාළ අතිරේක ක්‍රමවේදයන් ගොඩ නගා ගැනීමට පහසුකම් සපයනු මිස ඒවාට බාධා කිරීම නොකළ යුත්තේය.
- සැපයුම්කරුවන් විසින් අභ්‍යන්තර අර්බුද හා සේවක පැමිණිලි විසඳීම සඳහා ඵලදායී පැමිණිලිකරණ යාන්ත්‍රණයක් පිහිටුවිය යුතුය.

## 2.5. දරුණු හා අමානුෂික සැලකිලි

- සැපයුම්කරුවන් විසින් සේවකයින්ට ගරුත්වයෙන් හා අභිමානයෙන් යුක්තව සැලකිය යුතු අතර වධය, හිංසනය[4], බිය වැද්දීම, භීෂණය, ශාරීරික දඬුවම් හෝ කවර හෝ ආකාරයක අපයෝජනයක්[5] සිදු කිරීම හෝ ඊට අනුබල දීමෙන් වැළකිය යුතුය.
- සැපයුම්කරුවන් විසින් ලිඛිත විනය ක්‍රියා පටිපාටීන් පිහිටුවා, ඒවා සිය සේවකයින්ට පැහැදිළි වන ලෙස විස්තර කර සියලු විනය ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් වාර්තා තබා ගත යුතුය.
- විනය ක්‍රියා මාර්ග සමානුපාතික වන අතර ඒවාට කායික හෝ මානසික දඬුවම් අයත් නොවන බවට සැපයුම්කරුවන් විසින් වග බලා ගත යුතුය.

## 2.6. සෞඛ්‍ය හා සුරක්ෂිතතාව

- සැපයුම්කරුවන් විසින්වැඩ කිරීම සඳහා ප්‍රමාණවත් ආලෝකය, තාපය හා වාතාශ්‍රය සහිත සුරක්ෂිත හා සනීපාරක්ෂිත ස්ථානයක් සැපයිය යුතුය.
- සැපයුම්කරුවන් විසින් රසායන ද්‍රව්‍ය ආරක්ෂිත ලෙස පරිහරණය හා ගබඩා කිරීම, යන්ත්‍රෝපකරණවල සුරක්ෂිතතාව, ඉලෙක්ට්‍රොනික සුරක්ෂිතතාව, නිවාස පහසුකම් ඇත්නම් ඒවා ඇතුළුව ගොඩනැගිලිවල සුරක්ෂිතබව, ශක්තිය හා ස්ථායී බව තහවුරු කිරීමෙන් හා ගිනි අනතුරුවලට එරෙහිව ප්‍රමාණවත් ආරක්ෂාවක් සපයා දීම මගින් වැඩ කිරීමේ දී සිදු විය හැකි සෞඛ්‍ය අනතුරු හා හානි වැළැක්වීමට කටයුතු සූදානම් කළ යුතුය.
- සැපයුම්කරුවන් විසින් සේවකයින්ට ගිනි ආරක්ෂණ පුහුණුව, අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණුව හා රසායන ද්‍රව්‍ය හා අනෙකුත් හානිකර ද්‍රව්‍ය පරිහරණය ඇතුළුව ක්‍රමවත් සෞඛ්‍ය හා සුරක්ෂිතතා පුහුණුවක් ලබා දිය යුතුය.
- සැපයුම්කරුවන් විසින් පිරිසිදු වැසිකිළි පහසුකම්, පානීය ජලය හා අදාළ වන්නේ නම් ආහාර පිළියෙල කිරීම හා ගබඩාකරණය සඳහා සනීපාරක්ෂණ පහසුකම් සැපයිය යුතුය.
- ශයනාගාර පහසුකම් සපයා ඇත්නම් ඒවා පිරිසිදු, සුරක්ෂිත හා සේවකයින්ගේ අවශ්‍යතා සපුරාලන අන්දමේ ඒවා විය යුතුය.

## 2.7. අවදානමට ලක් විය හැකි පුද්ගලයින් ආරක්ෂා කිරීම

- සැපයුම්කරුවන් විසින් කාන්තාවන්, නිවාස සේවකයින්, නියෝජ්‍යායතන සේවකයින්, තාවකාලික සේවකයින් හා සංක්‍රමණික සේවකයින් වැනි අනිසි ශ්‍රම පරිචයන්ට ගොදුරු වීමේ අවදානමක් ඇත්තවුන්ගේ අයිතීන්ට විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය.
- නිවාස සේවකයින් සේවයෙහි යොදවන සැපයුම්කරුවන් විසින් ආචාර ධර්ම සංග්‍රහය සඳහා වන ආධාරක මාර්ගෝපදේශවල අන්තර්ගත නිවාස සේවකයින් යොදා ගැනීම පිළිබඳ C&A මාර්ගෝපදේශවලට අනුගත විය යුතුය.

4. ලිංගික හිංසනය ඇතුළුව.
5. ශාරීරික, මානසික හා වාචික අපයෝජනය ඇතුළුව

## 2.8. විධිමත් ලෙස සේවයෙහි යෙදවීම

- සැපයුම්කරුවන් විසින් ජාතික නීති හා පරිචයන් ඔස්සේ ස්ථාපිත පිළිගත් සේවා සබඳතාවක් මත පදනම්ව සේවකයින් සමග කටයුතු කළ යුතුය.
- සැපයුම්කරුවන් විසින් එබඳු සබඳතාවකින් පැන නඟින නෛතික බැඳීම් වැළැක්වීමට උත්සාහ නොකළ යුතුය.[6].

## 2.9. වේතන

- සැපයුම්කරුවන් විසින් නීතිය විසින් නියම කරන හා/ හෝ කර්මාන්ත මිනිත ප්‍රමිතීන් යන දෙකෙන් ඉහළ පරිමාව සපුරන හෝ ඉක්මවන වේතන, අතිකාල දීමනා, වරප්‍රසාද හෝ වැටුප් සහිත නිවාඩු සේවකයින්ට ලබා සිය යුතුය.
- සැපයුම්කරුවන් විසින් සේවකයින් සියලු අතිකාල දීමනා සඳහා සාමාන්‍ය ගෙවුම් අනුපාතයෙන් 125%ට අඩු නොවන, හෝ නීතියෙන් ඉල්ලා තිබේ නම් ඊට වැඩි දීමනාවක් ලබා දිය යුතුය.
- වේතන හා වන්දි[7] නිසි කලට හා ක්‍රමානුකූලව ගෙවෙනු ලැබිය යුතු අතර එමගින් සේවකයින්ට සහ ඔවුන්ගේ පවුල්වල අයගේ මූලික අවශ්‍යතා සපුරාලීමට හා විකල්ප ආදායමක් සැපයීමට සමත් විය යුත්තේය.
- සැපයුම්කරුවන් විසින් ජාතික නීතිවලින් සපයා දී නැති අන්දමින් හෝ විනය නීතියක් වශයෙන් හෝ වේතනවලින් අවකරණයන් සිදු නොකළ යුතුය.
- සැපයුම්කරුවන් විසින් සේවය ඇරඹීමට පෙරාතුව හා වැටුප් ලබා දෙන සෑම අවස්ථාවක දීමත් ඔවුන්ගේ වැටුප් පිළිබඳ විස්තර ඇතුළුව සේවා නියුක්ති කොන්දේසි පිළිබඳ ලිඛිත හා පැහැදිළි තොරතුරුසේවකයින් වෙත ලබා දිය යුතුය.

## 2.10. වැඩ කරන පැය ගණන

- සැපයුම්කරුවන් විසින් අතිකාල හැර සතියකට උපරිම පැය 48ක් සහිතව ගිවිසුමක් මගින් ජාතික නීතියට හෝ සාමූහික ගිවිසුම්වලට අනුකූල වන ආකාරයේ සම්මත වැඩ කරන පැය ගණනක් නිර්ණය කරනු ලැබිය යුත්තේය.
- සැපයුම්කරුවන් විසින් වගකීම් සහගත ලෙස අතිකාල වැඩ ප්‍රයෝජනයට ගනිමින් දෛනික පදනමකින් අතිකාල වැඩ ඉල්ලා සිටීම නොකළ යුතු අතර අතිකාල ස්වේච්ඡාවෙන් සිදු කළ යුතු බව අවබෝධ කරගෙන, එනයින් සේවකයන්ට අතිකාල වැඩ කිරීමට බල කිරීමෙන් වැළකිය යුතුය.
- සත්‍ය වශයෙන්ම ව්‍යතිරේකී වූ හෝ පූර්වානුමාන කිරීමට නොහැකි වූ සිද්ධීන්හි හැර වැඩ කරන පැය ගණන ඕනෑම දින හතක කාලයක් සඳහා පැය 60 නොඉක්මවිය යුත්තේය[8].
- සැපයුම්කරුවන් විසින් සේවකයින්ට විවේකයන් ලබා ගැනීමටත් සෑම දින හතක කාල පරිච්ඡේදයකටම අවම වශයෙන් එක් දිනක් හෝ නිවාඩු ලබා ගැනීමටත් [9], ව්‍යස්ථාපිත නිවාඩු දින භුක්ති විඳීමටත් අවකාශ ලබා දිය යුත්තේය.

---

6. නිදසුනක් ලෙසෙ, අයෝග්‍ය ලෙස යෙදූ ආධුනිකත්ව යෝජනා ක්‍රම හෝ ස්ථාවර ගිවිසුම් අධික ලෙස භාවිතා කිරීම මගින්.
7. සම්මත රාජකාරී පැය සඳහා, එනම් අතිකාල රහිතව.
8. සහ පහත සියලු කොන්දේසි සපුරාලනු ලබන්නේ නම් පමණක්: 1) ජාතික නීතියෙන් අවසර දෙන්නේ නම්, 2) සාමූහික ගිවිසුමකින් ඉඩ ලබා දෙන්නේ නම්, හා3) සේවකයින්ගේ සෞඛ්‍යය සහ සුරක්ෂිතතාව සුරැකීමට ආරක්ෂිත පියවර ගෙන තිබේ නම්.
9. හෝ ජාතික නීතියෙන් අවසර දී ඇති විටක සෑම දින 14ක කාල පරිච්ඡේදයක් සඳහාම දින දෙකෙක නිවාඩු..

# 3. පරිසරය

කර්මාන්තයක් වශයෙන් අනාගතයේ සාර්ථකත්වය අත් පත් කර ගැනීම සඳහා යහ පාරිසරික ක්‍රියාකාරීත්වය පූර්ව අවශ්‍යතාවක් බැව් C&A විශ්වාස කරයි. එබැවින්, කාලය ගත වීමත් සමග සැපයුම්කරුවන් විසින් අනුකූල වීමට ඔබ්බෙන් ගොස් පාරිසරික ක්‍රියාකාරීත්වය සක්‍රිය ලෙස කළමනාකරණය කරනු ඇතැයි C&A අපේක්ෂා කරයි. අවශ්‍ය තන්හි දී, සැපයුම්කරුවන්ට අනුකූලතාව කරෙහි ළඟා වීමට උපකාර කිරීම සඳහා C&A විසින් සැපයුම්කරුවන් සමග සමීපව කටයුතු කරනු ඇත.

## 3.1. නීතිවලට අනුකූලතාව දැක්වීම

- සැපයුම්කරුවන් විසින් සියලු අදාළ දේශීය හා ජාතික පරිසරය සුරැකීමේ නීති හා රීතිවලට අනුකූලතාව දැක්විය යුතු අතර ජාත්‍යන්තර පරිසරය සුරැකීමේ ප්‍රමිතීන් වෙත ළඟා වීමට ඉලක්ක කර ගත යුතුය.
- සැපයුම්කරුවන් විසින් අවශ්‍ය සියලු පාරිසරික අවසරපත් ලබා ගෙන ඒවා යථාවත්ව තබා ගත යුතුය.

## 3.2. පාරිසරික ක්‍රියාකාරීත්ව කළමනාකරණය

- සැපයුම්කරුවන් සතුව පාරිසරික කළමනාකරණ පද්ධතියක්[10] තිබිය යුතු අතර පාරිසරික ක්‍රියාකාරීත්වය පිළිබඳ වගකීම ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නියෝජිතයකු වෙත පැවරිය යුතුය.
- සැපයුම්කරුවන් විසින් බලශක්ති හා ජල පරිභෝජනය, පරිසරයට නිකුත් කරන විමෝචන හා අපද්‍රව්‍ය බැහැර කිරීම් ගණනය කළ යුතු අතර එකී තොරතුරු C&A විසින් ඉල්ලූ විටක ලබා දිය යුතුය.
- සැපයුම්කරුවන් විසින් ව්‍යාපාරික තීරණ ගැනීමේ දී පාරිසරික බලපෑම සැලකිල්ලට ගත යුතු අතර පාරිසරික ක්‍රියාකාරීත්වය දියුණු කිරීම කරෙහි ප්‍රගතිශීලී ප්‍රවේශයක් ලබා ගනිමින් සිය සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්තුකරුවන් විසින් ද එම පරිචයන්ම අනුගමනය කරනු ලබන බවට වග බලා ගත යුතුය.

## 3.3. සම්පත් පරිභෝජනය හා දේශගුණ විපර්යාසය

- සැපයුම්කරුවන් විසින් ගොඩනැඟිලි, ප්‍රවාහනය හා නිෂ්පාදනයෙහි බලශක්ති කාර්යක්ෂමතාව අඛණ්ඩව වැඩි දියුණු කිරීම සඳහා පියවර ගත යුතු අතර අලුත් කළ හැකි හෝ අඩු කාබන් තීව්‍රතා බලශක්ති ප්‍රභවයන් භාවිතා කිරීමට සාධාරණ ප්‍රයත්නයන් ගත යුතුය.
- ආර්ද්‍ර පිරිසැකසුම්කරණයෙහි යෙදෙන සැපයුම්කරුවන් අඛණ්ඩ ලෙස ජල කාර්යක්ෂමතාව දියුණු කිරීම සඳහා පියවර ගත යුතුය.
- සැපයුම්කරුවන් විසින් සිය මිල දී ගැනීමේ තීරණ වනහරණය, සතුන්ට ක්‍රෑර ලෙස සැලකීම හෝ අනතුරට ලක් විය හැකි පරිසර පද්ධති හෝ වඳ වී යන විශේෂයන්[11] කරෙහි අහිතකර බලපෑම් ඇති නොකරන බවට සහතික කිරීම සඳහා සාධාරණ ප්‍රයත්නයන් දැරිය යුතුය.

---

10. පාරිසරික කළමනාකරණ පද්ධතියක් යනු පාරිසරික ක්‍රියාකාරීත්වය මැනීම, කළමනාකරණය හා වාර්තා කිරීම සඳහා වන ලිඛිත ප්‍රතිපත්ති, සැලසුම්කරණ මෙවලම් හා ක්‍රියා පරිපාටීන් සමූහයක එකතුවකි.
11. CITES හා IUCN රතු දත්ත ලැයිස්තුවේ නිර්ණය කර ඇති පරිදි

## 3.4. අපද්‍රව්‍ය හා විමෝචක

- සැපයුම්කරුවන් විසින් සැලසුම් හා මෙහෙයුම් කාර්යක්ෂමතාව ඔස්සේ අපද්‍රව්‍ය අවම කර ගැනීමට පියවර ගත යුතු අතර හැකි සෑම විටකම නැවත භාවිතය හා ප්‍රතිචක්‍රීකරණයට පහසුකම් සපයනු ලැබිය යුත්තේය.

- සැපයුම්කරුවන් විසින් අපජලය බැහැර කිරීමට පෙර ඊට නිසි පරිදි පිළියම් කළ යුතු අතර සියලු ජාතික හා දේශීය ජලය බැහැර කිරීමේ අනුකූලතා ප්‍රමිතීන්ට අනුගත වන පරිදි අපජලය පරීක්ෂාවට ලක් කර C&A විසින් ඉල්ලුම් කරනු ලැබූ විටක පාර්ශ්වකරුවන් සමග අපජල ගුණත්ව දත්ත ලබා දිය යුතුය.

- සැපයුම්කරුවන් විසින් ශබ්ද දූෂණය හා වාතය, පස හා භූගත ජලය වෙත වන විමෝචනයන් අවම කිරීමට පියවර ගත යුතුය.

## 3.5. අනතුරුදායක රසායන ද්‍රව්‍ය

- සැපයුම් දාමය තුළින් අනතුරුදායක ද්‍රව්‍ය ඉවත් කිරීම සම්බන්ධයෙන් සැපයුම්කරුවන් විසින් C&A හා ස්වකීය සැපයුම්කරුවන් සමග එක්ව කටයුතු කළ යුතුය.

# 4. දූෂණයට එරෙහි වීම

සැපයුම්කරුවන් විසින් ව්‍යාපාර පරිචයන්හි දී උසස් සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුගත වනු ඇතැයිC&A උදක්ම අපේක්ෂා කරයි.

- සැපයුම්කරුවන් විසින් අදාළ සියලු අල්ලස් විරෝධී හා දූෂණ නීතිවලට අනුකූලතාව දැක්විය යුතුය.

- සැපයුම්කරුවන් විසින් සුසාධ්‍යකරණ ගෙවීම් ඇතුළුව අල්ලස් පිරිනැමීම, ගෙවීම, ඉල්ලා සිටීම හෝ පිළිගැනීම නොකළ යුත්තේය.

- සැපයුම්කරුවන් සතුව දූෂණ විරෝධී ප්‍රතිපත්තියක් හා කාර්ය පරිපාටියක් තිබිය යුතු අතර ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව සහතික කර ගැනීම සඳහා නිතර සමාලෝචනය කරනු ලැබිය යුත්තේය.

# ආචාර ධර්ම සංග්‍රහයට අනුකූල වන බව සහතික කර ගැනීම

**ආචාර ධර්ම සංග්‍රහයේ අවශ්‍යතාවන් සමග පූර්ණ වශයෙන් අනුගත වීම අභියෝගාත්මක විය හැකි බව C&A පිළිගන්නා නමුත්, මෙය C&A මෙන්ම එහි සැපයුම්කරුවන්ගේ ද අනාගත වෙළෙඳ සාර්ථකත්වය සඳහා තීරණාත්මක වන බව විශ්වාස කරයි.**

ආචාර ධර්ම සංග්‍රහයට අනුගත වීම අගේ තත්ත්ව ප්‍රමිතීන්ට හා බදො හැරීමේ නියමයන්ට අනුකූල වීම තරමටම වැදගත් බව සිහි තබා ගත යුතුය. විවෘත, අවංක හා අඛණ්ඩ දියුණුව කෙරෙහි කැප වී සිටින සැපයුම්කරුවන් සමග කටයුතු කිරීමට C&A විසින් දැඩිව උත්සාහ කරනු ඇති අතර ඔවුන්ට අවශ්‍යතා වෙත ළඟා වීම සඳහා සහාය ලබා දෙනු ඇත.

## 1. ක්‍රියාකාරිත්වය කළමනාකරණය

- සැපයුම්කරුවන්ට ආචාර ධර්ම සංග්‍රහය කෙරෙහි අනුකූලතාව සක්‍රියව කළමනාකරණය කිරීම සඳහා ඵලදායී කළමනාකරණ පද්ධතියක් තිබිය යුතු අතර අනුකූලතාව පිළිබඳ වගකීම ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නියෝජිතයකු වෙත පැවරිය යුතුය.

- සැපයුම්කරුවන් විසින් සේවකයින්ව ආචාර ධර්ම සංග්‍රහයේ අවශ්‍යතා පිළිබඳ දැනුවත් කළ යුතු අතර ඒවාට ළඟා වන ආකාරය පිළිබඳ සිය සුපරීක්ෂකවරුන් හා කළමනාකරුවන් පුහුණු කළ යුතුය.

- සැපයුම්කරුවන් විසින් නිතර අභ්‍යන්තර ඇගයීම් පවත්වනු ලැබිය යුත්තේය.

- නිෂ්පාදනය ඇරඹීමට පෙර හිමිකාරිත්වය සතු හෝ කොන්ත්‍රාත්තු පදනම මත පැවරූ සියලු නිෂ්පාදන ඒකක සඳහා සැපයුම්කරුවන් C&A වෙතින් අවසර ලබා ගත යුතුය. අවසර නොලත් නිෂ්පාදන ඒකක භාවිතය සපුරා තහනම්ය.
- C&A වෙතින් වන පූර්ව ලිඛිත අවසරයකින් තොරව සැපයුම්කරුවකු හට නිෂ්පාදන ක්‍රියාදාමයේ කිසිදු කොටසක් කොන්ත්‍රාත් පදනම මත ලබා දිය නොහැකි අතර එසේ ලබා දිය හැක්කේ,අ) කොන්ත්‍රාත්කරු විසින් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූල වීමට එකඟ වීමෙන් හා ආ) කොන්ත්‍රාත්කරු විගණන පරීක්ෂණයක් සමත් වූ පසු පමණි.
- කොන්ත්‍රාත්කරුවන් විසින් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූල වන බවට වග බලා ගැනීම සැපයුම්කරුවන් සතු වගකීමකි.

## 2. අධීක්ෂණය හා විනිවිදභාවය

- දැනුම් දී හෝ දැනුම් නොදී C&A හා/හෝ එහි නියෝජිතයින් විසින් ඇගයීම් සිදු කිරීමට සැපයුම්කරුවන් ඉඩ ලබා දිය යුතුය.

- සැපයුම්කරුවන් ඇගයීමක් අතරතුර සහයෝගාත්මක හා විනිවිදභාවයකින් යුක්ත විය යුතු අතර සේවකයින්, වාර්තා, වැඩ ප්‍රදේශ හා අදාළ වන්නේ නම් ශයනාගාර වෙත සීමා නොකළ ප්‍රවේශය ලබා දිය යුතුය.

- සේවකයින් සමග පවත්වන සම්මුඛ සාකච්ඡා පුද්ගලිකත්වය සුරැකෙන ස්ථානයක පැවැත්වීමට සැපයුම්කරුවන් විසින් ඉඩ සැපයිය යුතු අතර ප්‍රශ්නවලට පිළිතුරු දිය යුත්තේ කෙසේද යන්න ගැන සේවකයින්ට උපදෙස් දීමෙන් වැළකිය යුතුය.

- අනුකූලතාව ඵලදායී ලෙස ඇගයුම් කළ හැකි වන පරිදි සැපයුම්කරුවන් විසින් සම්පූර්ණ හා නිවැරදි වාර්තා පවත්වා ගත යුතු අතර[12] තොරතුරුවලට බලපෑම් කිරීම හෝ එහි මෙහෙයුම් සම්බන්ධ කවර හෝ පැතිකඩක් වැරදි ලෙස අර්ථ නිරූපණය කිරීම නොකළ යුතුය.

- සැපයුම්කරුවන් විසින් C&A වෙත සැපයුම්කරුවන්ගේ හා නිෂ්පාදන ඒකකවල නම් හා ස්ථාන මෙන්ම ආචාර ධර්ම සංග්‍රහය යටතේ ඔවුන්ගේ කාර්යසාධනය පිළිබඳව ද තවෙනි පාර්ශ්වයන්ට අනාවරණය කිරීමට ඉඩ දිය යුතුය.

- සැපයුම්කරුවන් විසින් C&A විසින් ඉල්ලුම් කරනු ලැබූ විට C&A හා/හෝ එහි නියෝජිතයින්ට ස්වකිය සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ විගණන පරීක්ෂණ පැවැත්වීමට සහාය ලබා දිය යුතුය.

## 3. සම්බාධක

- සැපයුම්කරුවන්, කම්හල් සේවකයින් හා C&A සේවකයින් ඇතුළු සියලු පාර්ශවකරුවන්ට සදාචාර විරෝධී චර්යයාවන් හා ආචාර ධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීම් ගැන C&Aහි කළමනාකාරිත්වය වෙත දැන්විය හැකි ශෝධ්‍යතා නාලිකාව නමින් හැඳින්වෙන රහස්‍ය නළා හැඬවීමේ පද්ධතියක් C&A සතු වේ.

- ආචාර ධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීමක් සිදු වුවහොත් C&A විසින් අවශ්‍ය නම් C&Aහි සහාය ද ඇතිව සංවර්ධන සැලැස්මක් ගොඩ නංවා උල්ලංඝනයේ ස්වභාවය අනුව තීරණය වන නිශ්චිත කාල රාමුවක් ඇතුළත එය ක්‍රියාත්මක කරන ලෙස සැපයුම්කරු වෙතින් ඉල්ලා සිටිනු ඇත.

- ළමා ශ්‍රමය, බලහත්කාර හෝ සිරකාර ශ්‍රමය, අල්ලස්, වංචා, ව්‍යාජ සංරචක භාවිතය හා අවසර නොලත් නිෂ්පාදන ඒකක භාවිතය ඇතුළු ඊට ද අමතර බරපතළ උල්ලංඝනය කිරීමක් සිදුව ඇත්නම් හා/හෝ එකඟ වූ සංවර්ධන සැලැසුම් ක්‍රියාත්මක කිරීමට නැවත නැවතත් අසමත් වන්නේ නම්,ඉදිරියට ලැබීමට ඇති ඇණවුම් අවලංගු කිරීම ඇතුළුව සැපයුම්කරු සමග ඇති ව්‍යාපාර සබඳතාව අවසන් කිරීමේ අයිතිය C&A සතු වේ.

- සැපයුම්කරුවන්ගේ කොන්ත්‍රාත්කරු(වන්) ඇතුළුව සැපයුම්කරුවන් මගින් සිදු කරනු ලබන ආචාර ධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීමෙන් පැන නගින ආදායම් හා/හෝ ප්‍රතිලාභ අහිමි වීම ඇතුළුව C&A විසින් දරනු ලබන කවර හෝ හානියක් හා කවර හෝ වියදමක්පිළිබඳ වගකීම සැපයුම්කරුවන් වෙත පැවරෙනු ඇත.

වඩා යහපත් ශ්‍රම තත්ත්වයන් හා පාරිසරික ක්‍රියාකාරීත්වයන් වෙත ළඟා වීම සඳහා එක්ව කටයුතු කිරීමට අවංකව කැප වී සිටින සැපයුම්කරුවන් සමග දිගු කාලීන සබඳතා පවත්වා ගැනීමට C&A අපේක්ෂා කරන අතර ඔවුන් විසින් මුහුණ ලැබිය හැකි දුෂ්කරතාවලින් අත් මිදීමට සහාය දක්වනු ඇත. ආචාර ධර්ම සංග්‍රහය ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩිදුර පැහැදිළි කිරීම් හා මාර්ගෝපදේශ සඳහා නිතර යාවත් කරනු ලැබෙනු ඇති ආචාර ධර්ම සංග්‍රහය සඳහා ආධාරක මාර්ගෝපදේශ බලන්න

12. නිදසුන් ලෙස රාජකාරී පැය වාර්තා හා වැටුප් ලේඛන